මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2022.04.18 |

# ශ්‍රී ලංකා ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2022 මාර්තු

## මාර්තු මාසයේ දී නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශක ඉහළ යන ලදී.

**සෑම වසරකම මාර්තු මාසයේ නිෂ්පාදන ක්‍රියාකාරකම්වල දක්නට ලැබෙන වර්ධනයට අනුරූපව, එහෙත් සාපේක්ෂව අඩු වේගයකින් 2022 මාර්තු මාසයේ දී නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය පෙර මාසයට සාපේක්ෂව, දර්ශකාංක 57.8ක් දක්වා ඉහළ යන ලදී.** උත්සව සමයේ ඉල්ලුම ඉහළ යෑම සමග නිෂ්පාදන, නව ඇණවුම් සහ සේවා නියුක්තිය යන උප දර්ශකයන්හි දක්නට ලැබුණු වර්ධනය මෙම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.


| නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය | 2022 පෙබරවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 5.3ක ඉහළ යෑමකි |
|---|---|
| **57.8** | |

විශේෂයෙන් රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශකයන්හි දක්නට ලැබුණු වර්ධනය කෙරෙහි, උත්සව සමය වෙනුවෙන් ලබා දෙන නිවාඩු දින ආවරණය කිරීම උදෙසා මෙම මාසයේ දී නිෂ්පාදනය වැඩි කිරීම හේතු විය. අලුත් අවුරුදු සමයේ ඇතිවන ඉල්ලුමට සරිලන සේ, 2022 මාර්තු මාසයේ දී ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි නව ඇණවුම් ඉහළ ගිය ද, ඊට අදාළ නිෂ්පාදන සහ තොග මිල දී ගැනීම් පහළ අගයක පැවතුණු අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් සැපයුම් අංශයේ සීමාකම් හේතු විය. සැලසුම්ගත විදුලිය කප්පාදුව මධ්‍යයේ පවතින ඉන්ධන හිඟය, ද්‍රව්‍ය සැපයුමේ සිට කම්කරු ප්‍රවාහනය දක්වා විවිධ අංශ වලින් තම නිෂ්පාදන සැලසුම්වලට බාධා ඇති කළ බව බොහෝ ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. ඇණවුමක් සැපයීමට ගතවන කාලය ද පෙර මාසයට සාපේක්ෂව ඉහළ යන ලදී. තවද, දේශීය වෙළඳපොළ තුළින් අවශ්‍ය ප්‍රමාණයට ද්‍රව්‍ය මිලදී ගැනීමට නොමැති වීම සහ ද්‍රව්‍ය ආනයනය සඳහා ණයවර ලිපි නිකුත් කිරීමේ දුෂ්කරතා හේතුවෙන් තොග මිලදී ගැණුම් පහළ යන ලදී.

| විචලයය | පෙබ. | මාර්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **52.5** | **57.8** | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| **උපදර්ශක** | | | | |
| නව ඇණවුම් | 59.0 | 66.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 45.0 | 56.9 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 46.5 | 52.2 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 47.5 | 45.2 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 63.6 | 57.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රට තුළ පවතින අවිනිශ්චිත තත්ත්වය හේතුවෙන්, ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන අපේක්ෂාවන්, පෙර මාසයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහත වැටුණි.




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2022 පෙබරවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.7කින් පහළ යමින් 2022 මාර්තු මාසයේ දී 53.0ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පෙර මාසයට සාපේක්ෂව 2022 මාර්තු මාසයේ දී එක්සත් ජනපදය සහ සිංගප්පූරුව යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වැඩි වේගයකින් ද යුරෝපා කලාපයේ සහ එක්සත් රාජධානිය, ඉන්දියාව යන රටවල අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, චීනය සහ රුසියාව යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පෙර මාසයට සාපේක්ෂව මාර්තු මාසයේ දී පහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2022 අප්‍රේල් 16 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයේ වර්ධනයක් පෙන්නුම් කරමින් සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 මාර්තු මාසයේ දී 51.3ක දර්ශක අගයක් වාර්තා කළ අතර,** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ සේවා නියුක්තිය යන උප දර්ශකවල ඉහළ යෑම් හේතු විය.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, අනෙකුත් පෞද්ගලික සේවා, විදුලි සංදේශ සහ රක්ෂණ යන උප අංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමඟ, 2022 පෙබරවාරි මාසයට සාපේක්ෂව 2022 මාර්තු මාසයේ දී නව ව්‍යාපාර වැඩි වේගයකින් ඉහළ ගියේය.

පෙර පැවති ප්‍රවණතාවට අනුකූලව, ව්‍යාපාර ක්‍රියාකාරකම් අඩු වේගයකින් වුවද, මාර්තු මාසයේ දී අඛණ්ඩව වර්ධනය විය. ඒ අනුව, මූල්‍ය සේවා, ප්‍රවාහන, රක්ෂණ, දේපළ වෙළඳාම සහ පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදන යන උප අංශවල වර්ධනයන් මාර්තු මාසය තුළ වාර්තා විය. කෙසේ වුවද, මෙහෙයුම් පිරිවැය ඉහළ යෑම, අඛණ්ඩ විදුලි කප්පාදුව සහ ගෑස්, ඉන්ධන හා අනෙකුත් යෙදවුම් සම්බන්ධව පවතින සැපයුම් හිඟය බොහෝ උප අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. එමෙන්ම, ජීවන වියදම ඉහළ යෑම සහ රුසියා-යුක්රේන යුද්ධය තවත් සේවා උප අංශ කිහිපයකට අදාළ ඉල්ලුම කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. ඒ අනුව, විශේෂයෙන්ම තොග සහ සිල්ලර වෙළඳාම, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා, මහජන සෞඛ්‍ය කටයුතු සහ අධ්‍යාපන යන උප අංශවලට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම් මාර්තු මාසය තුළ දී පහළ යෑමක් වාර්තා කළේය.

සේවා නියුක්ති උපදර්ශකය, මූලික වශයෙන් සෘතුමය ඉල්ලුම සපුරාලීම සඳහා සිදු කරන ලද නව බඳවා ගැනීම් හේතුවෙන් මාර්තු මාසයේ දී ඉහළ යෑමක් වාර්තා කළේය. මේ අතර, මාර්තු මාසයේ දී නිමකිරීමට නියමිත කාර්යයන් අඩු වේගයකින් අඛණ්ඩව පහළ ගියේය.

| විචල්‍යය | පෙබ. | මාර්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **51.8** | **51.3** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 55.0 | 56.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 56.5 | 52.1 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 47.0 | 54.2 | - | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 46.3 | 48.9 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 54.0 | 44.8 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් 2021 අගෝස්තු මාසයෙන් පසු පළමු වරට පහත වැටුණු අතර, මේ සඳහා අඛණ්ඩ විදුලි කප්පාදුව, ඉන්ධන, ගෑස් සහ අනෙකුත් යෙදවුම් සම්බන්ධව පවතින සැපයුම් හිඟය, විදේශ විනිමය හිඟය මධ්‍යයේ පවතින ආනයනය සම්බන්ධ ගැටළු හා සීමා කිරීම්, විනිමය අනුපාතිකය නම්‍යශීලී වීමට ඉඩ හැරීම සමග යෙදවුම් මිලෙහි සිදුවූ තියුණු ඉහළ යෑම් මෙන්ම දේශපාලන හා සමාජ නොසන්සුන්තා සමඟ රට තුල වර්ධනය වන අවිනිශ්චිතතා සහ අභියෝග හේතු විය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**51.3**

**2022 පෙබරවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.5ක පහළ යෑමකි.**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි වර්ධනයක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 පෙබරවාරි මාසයේ පැවති 54.0 සිට 2022 මාර්තු මාසයේ දී 53.4ක් වාර්තා කළේය.

ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2022 මාර්තු මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, චීනයේ සහ ජපානයේ එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2022 අප්‍රේල් 16 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.